# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1763/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 27/11/2024<br>පැය 1135 |

## මාධ්‍ය නිවේදනය

## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.11.26 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වීරකැටිය පොලිස් වසමේ මීගස්ආර ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 740 ක් සන්තකයේ තබා ගනිමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වීරකැටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 31 වන පසුවන වලස්මුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වීරකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2024.11.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වදුරඹ පොලිස් වසමේ බද්දේගම ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 490 ක් හා විද්‍යුත් තරාදියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වදුරඹ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ වදුරඹ ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** වදුරඹ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුරය කඳවුර.**

2024.11.26 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුරය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගාලදිවුල්වැව පොලිස් වසමේ

නොච්චියාගම ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 46ක් , ගෑස් සිලින්ඩර් 01 ක්, තඹ දඟර 01 හා යකඩ බැරල් 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන** ගාලදිවුල්වැව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. ගාලදිවුල්වැව** පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**